# 15 අප වඩා සිටුවන වැඩිහිටියෝ (තිත්තිර ජාතකය)

ශ්‍රද්ධාවන්ත පින්වතුනි, අද ඔබ මේ සූදානම් වන්නේ වෙනදා වගේම ජාතක දේශනාවකට ඇහුම් කම් දීමටයි. අද මා දේශනාවට තෝරා ගත්තේ තිත්තිර ජාතකය යි. එයින් කියවෙන්නේ වැඩිහිටියන්ට සැලකීම ගැන යි. මව්පියෝ වැඩිහිටියෝ, මව්පියන්ගෙත් මව්පියෝ, ආච්චිලා, සීයලා වැඩිහිටියෝ, ගුරුවරු වැඩිහිටියෝ මේ වාගේ අපි දන්න නොදන්න, හඳුනන නොහඳුනන අපමණ වැඩිහිටියෝ අපේ එදිනෙදා ජීවිතයේදී අපට හමුවෙනවා ඒ වැඩිහිටියෝ තමයි. ලෝකේ හදළ දෙන්නේ, මග පෙන්නල දෙන්නේ, අපව රැක බලාගන්නේත් ඒ වැඩිහිටියෝ තමයි. වැඩිහිටියන් නැතුව අපට ජීවිතයක් නැහැ. මේ කාරණය සිතේ තබාගෙන කවුරුත් ඉතා ඕනෑ කමින් මේ දේශනාවට ඇහුම් කම් දෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

## වත්මන් පුවත

අනේපිඬු මහ සිටුතුමා ජේතවනාරාම මහා විහාරය කරවා එය පූජා කිරීමේ උත්සවයට බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළා. බුදුහාමුදුරුවෝ මහා සංඝයා පිරිවරාගෙන රජගහනුවර සිට සැවැත් නුවර බලා වැඩම කළා. මේ සංඝයා අතර ඡබ්බග්ගිය කියලා ටිකක් නොහික්මුණු හාමුදුරුවරු හය නමක් හිටියා. උන්වහන්සේලාට එවැනි ම ගෝල පිරිසකුත් හිටියා.





නොමිලේ බෙදා හැරීම පිණිසයි.

ඒ ඇත්තෝ අනෙක් සංඝයාට කලින් ඉක්මනින් සැවැත් නුවර ජේතවනාරාමයට ගියා. ගිහින් හොඳ හොඳ කාමර තමන්ගේ ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලාට කල් ඇතිව ම වෙන්කර ගත්තා. බුදුරජාණන්වහන්සේ සමඟ වැඩම කළ භික්ෂූන් වහන්සේලා කාටත් ආසන පහසුකම් ලැබුණා. සැරියුත් මහ රහතන් වහන්සේ අතර මගදී ලෙඩවෙන, ගමන් අපහසුව ඇති දුර්වල භික්ෂූන් වහන්සේලාටත් ඇප උපස්ථාන කරමින් කාටත් පසුවයි ජේතවනාරාමයට වැඩියේ. ඒ වනවිට ආසන සියල්ල පිරිලා ඉන්න තැනක් තිබුණෙත් නැහැ ඒ නිසා උන්වහන්සේ ගසක් මුල රෑ ගත කළා. අලුයම සක්මන් කරන්න වඩින බුදුරජාණන් වහන්සේට සැරියුත් හාමුදුරුවන් හමුවුණා. ගසක් මුල වැඩ ඉන්නේ ඇයි දැයි ඇසුවාම ආසන ඉතිරි වී නොතිබුණ බව සැරියුත් හාමුදුරුවෝ පැවැසුවා. ඒ වෙලාවෙ බුදුහාමුදුරුවන්ට ''දැන් මා ජීවත්ව සිටියදී ම භික්ෂූන් වහන්සේලා ඔවුනොවුන්ට ගෞරවයක් නැතිව, ඔවුනොවුන් කෙරෙහි පිහිට වීමක් නැතිව වාසය කරන්නේ නම් මා පිරිණිවන් පෑවාම මොනවා නොකරත් ද'' යි ධර්ම සංවේගයක් ඇති වුණා. පසුදා උදෑසන බුදුරජාණන් වහන්සේ සංඝයා රැස්කරවා සැබෑද, ''මහණෙනි, ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා කල් ඇතිව පැමිණ වැඩිහිටි තෙරවරුන්ට සෙනසුන් අහිමි කළාද'' යි විමසුවා. ඒ සැබවැයි කීවිට ඡබ්බග්ගිය භික්ෂූන්ට අවවාද කරළා මෙසේ විමසුවා.

මහණෙනි, මූලාසනය මුලින්ම පැන් පිළිගැන්වීම, ආහාරයේ ප්‍රථම භාගය ලැබීමට සුදුස්සා කවුරු ද? එවිට සමහර භික්ෂූන්වහන්සේලා ක්‍ෂත්‍රිය කුලය වගේ උසස් කුල වල අය යැයි කීවා. සමහර කෙනෙක් ධර්ම ධරයන්, විනය ධරයන් හෝ ධර්ම කථිකයන් වහන්සේලා සුදුසුයැයි කීවා. තවත් කෙනෙක් ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන ලැබූ අය සුදුසු යැයි කීවා. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අරහත් ශ්‍රමණයන් හතරදෙනා තමයි මේ සාසනයේ වැදගත් ම සතර දෙනා, ඒ නිසා අග්‍රාසනය අග්‍රපිණ්ඩය ලැබීමට හොඳම සුදුස්සන් මාර්ග ඵල ලාභීන් යැයි බොහෝ දෙනෙක් කීවා. එවිට බුදුරජාණන් වහන්සේ ''මහණෙනි මේ තථාගත සාසනයේ අග්‍රාසන, අග්‍රභෝජන, අභිවාදන, පච්චුට්ඨාන (හුනස්නෙන් නැගිටීම), අඤ්ජලිකම්ම (දොහොත් මුදුන් දී වැඳීම), සාමීචිකම්ම (වතාවත් කිරීම) යන මේ සියල්ලට මුලින් ම සුදුසු කම් ලබන්නේ මේ කියන ලද කිසිකෙනෙකුන් නොවේ. මේ සියලු පූජා ගරුසත්කාර කළ යුත්තේ වැඩිහිටි පිළිවෙලට ම යි. සැම දේකදී ම මුල්තැන ලැබිය යුත්තේ වැඩිහිටි භික්ෂුවට යි. සැරියුත් තෙරුන් වහන්සේ මාගේ අග්‍රශ්‍රාවකයා යි. මා පැවැත් වූ ධර්ම චක්‍රය ඊළඟට පැවැත්වූයේ උන්වහන්සේ ය. මා ළඟට සෙනසුන් ලැබිය යුත්තේ උන්වහන්සේ ය.

එහෙත් ඊයේ රාත්‍රියේ උන්වහන්සේ සෙනසුනක් නැතිව ගසක් මුල ගත කර තිබේ. මේ ශ්‍රමණයන් අතර පමණකුත් නොව තිරිසනුන් අතර තිබුණු ගුණ ධර්මයැකැයි උතුම් ආචාර ධර්මය කැ'' යි වදාරා මේ ජාතක කථාව දේශනා කළ සේක.

## යටගිය පුවත

එකමක් එක කාලයක හිමාලය කඳු පාමුල එක මහා නුග ගසක් ඇසුරු කරගෙන යහලුවන් තිදෙනෙක් වාසය කළා. එනම් තිත්වටුවෙක්, වඳුරෙක් සහ ඇතෙක්. මේ තිදෙනා හොඳ යාලුවන් වුණාට කිසිකෙනෙකුට ගරුකිරීමක් කිසිකෙනෙකුට කීකරු වීමක් කිසිකෙනෙකුට අවනත වීමක් තිබුණේ නැහැ. යහලු කම් කරන වේලාවට යහලු කම් කළා. අනෙක් වෙලාවට එකිනෙකා ගැන සැලකිල්ලක් නැතිව තමන්ට කැමැති විදියට හිටියා.

මෙහෙම කලක් ගතවෙන විට ඔවුන්ට ම හිතුණා අප මෙහෙම විසීම හොඳ නැහැ. අපේ වැඩිහිටියෝ කවුදැයි සොයා ගෙන ඔවුන්ට වැදුම් පිදුම් කරමින් ගරු සරු කරමින් වාසය කරනවනම් ඔහුගේ උපදෙස් අනුව ක්‍රියාකරනවා නම් තමයි හොඳ කියලා හිතුණා. ඒ නිසා තමන් අතරින් වැඩිහිටියා කවුදැයි තෝරා ගන්න තීරණය කළා. ඒකට ඔවුන් අපූරු උපක්‍රමයක් යොදා ගත්තා. ඒක තමයි තමන් වාසය කළ නුගරුක ගැන වැඩිම කළක් දන්නා කෙනා සොයා ගැනීම.

ඇඟපතින් නම් ලොකුම කෙනා ඇතා. ඒ නිසා අනෙක් අය සිතුවේ වැඩිහිටියා වෙන්නේ ඇතා කියලා. ඒ නිසා මුලින් ම අනෙක් දෙදෙනා ඇතාගෙන් ඇසුවා මේ නුග ගස ගැන ඔබ කොතරම් කාලයක සිට දන්නවාද කියා. ඇතා කිව්වා ''මම තරුණ ඇත් පොව්වෙක්ව ඉන්න කාලේ මේ නුග පඳුර උඩින් මම ගියා එවිට මෙය මගේ බඩේ ගැවෙන නොගැවෙන තරම් ඇති'' කියලා. ඊළඟට ඇතාත් තිත් වටුවාත් වඳුරු යාලුවාගෙන් ඇහුවා ඔබ කොපමණ කාලයක ඉඳන් මේ නුග ගස ගැන දන්නවද කියලා. එවිට වඳුරා කියනවා යහලුවනි, මම වඳුරු පැටියෙකුව ඉන්න කාලේ බිම ඉඳගෙන බෙල්ල ඔසවන්නෙත් නැතිව මේ නුග පැලයේ දල්ල කෑ බව මට මතකයි. ඒ තරම් කාලක ඉඳලා මේ ගැන දන්නව'යි කීවා. මේ කථාවෙන් තේරුණේ කඳ විශාල නොවුණාට ඇතාට වඩා වඳුරා වැඩිමහලු බවයි.

තුන්වෙනුව ඇතත් වඳුරාත් එකතුවෙලා වටු යාළුවාගෙන් ඒ ප්‍රශ්න ඇසුවා. බලන්න ඔහු දීපු උත්තරේ. ''යහළුවනි, ඉස්සර අන්න අර පැත්තේ

එක තැනක මහා නුග රුකක් තිබුණා. මම ඒකෙන් ගෙඩියක් කාලා අවුත් වසුරු හෙලුවේ මෙතන. එයින් තමයි මේ නුග රුක හටගත්තේ. ඒ නිසා මම මේ නුග රුක ගැන දන්නේ, මේක පැලවෙන්නටත් කලින් ඉඳලයි කියලා තිත්වටුවා කිව්වා. අන්තිමේ එයින් හෙළදරව් වුණේ තුන්දෙනාගෙන් ම වැඩිහිටියා මේ පුංචි වටු යාළුවා බවයි.

ඒක අහළා ඇතත් වැඳුරත් තිත්තිර පණ්ඩිතයන්ට මෙහෙම කීවා. ''යහළුව, ඔබ තමයි අප තුන්දෙනාගෙන් ම වැඩිමහලු කෙනා. ඒ නිසා අප දෙන්නා මෙතැන් පටන් ඔබට සත්කාර ගරුකාර සම්මාන වැඳුම් පිදුම් කරනවා. ඒ වගේම නමස්කාර කිරීම, හුනස්නෙන් නැගිටීම, ඇඳිලිබැඳ වැඳීම, වතාවත් කිරීම ආදියත් කරනවා. එපමණක් නොවෙයි, අපි නිතරම ඔබගේ අවවාද අනුශාසනාවලට අනුව කටයුතු කරනවා. මින් මතු ඔබ අපට අවවාද අනුශාසනා කරන්න'' කියලා.

එතැන් පටන් තිත්තර පණ්ඩිතයාණන් අනෙක් දෙදෙනාට අවවාද අනුශාසනා කළා. තිදෙනා ම සිල් සමාදන් ව වාසය කළා. ඔවුනොවුන් ගරු කරමින් ඇප උපකාර කරමින් ඔවුනොවුන්ට අවනත වෙලා ජීවත්වෙලා මැරී දෙව් ලොව උපන්නා. ඔවුන්ගේ ඒ ප්‍රතිපත්තියට කියනවා **තිත්තිර බ්‍රහ්මචරියාව** කියලා.

බලන්න මහණෙනි. ඒ තිරිසන් සතුන් පවා ඔවුනොවුන්ට ගරු බුහුමන් කරමින් ඔවුනොවුන්ට ම අවනතවෙලා ජීවත් වුණා. නමුත් මේ වගේ මනාව දේශනා කළ සාසනයක පැවිදි වූ ඔබ වහන්සේලා, ඔවුනොවුන් කෙරෙහි ගෞරවයක් නැතිව ඔවුනොවුන්ට අවනත නොවී වාසය කරන්නේ කොහොම ද? ඒ නිසා මහණෙනි, අද මම මෙසේ පණවනවා, මෙතැන් පටන් ඔබවහන්සේලා වැඩිහිටි පිළිවෙළට අනුව වැඳීම, අසුනෙන් නැගිටීම, ඇඳිලිබැඳ ගරු කිරීම, වතාවත් කිරීම කළ යුතුයි.

ඒ වගේම අග්‍රාසනය අග්‍රපිණ්ඩය වැඩිහිටි පිළිවෙළට ලැබිය යුතුයි. මින්මතු කිසිදිනක බාල කෙනෙකු වැඩිහිටියෙකුට හිමි විය යුතු සෙනසුන නොවැළැක්විය යුතුයි. එසේ වැළැක්වුව හොත් දුක්කටාපත්තියක් සිදුවෙනවා'' යැයි විනය නීතියක් ද පනවා වදාරා මේ ගාථාව ද දේශනා කළා.

**යෙ වද්ධාමපචායන්ති - නරාධම්මස්ස කොවිදා**
**දිට්ඨෙව ධම්මෙ පාසංසා - සම්පරායෙ ච සුග්ගතිං**

මහණෙනි, ගිහි පැවිදි වේවා තිරිසන් වේවා වැඩිහිටියන්ට පිදීමටත් ගුණ ධර්මයෙහි දක්ෂ කවුරුන් හෝ කෙනෙක් ගුණවත් වැඩිහිටියන්ට වැදුම් පිදුම් කරනවා නම් ඔවුන් මේ ජීවිතයේ දී ම කාගේත් පැසසුමට ලක්වෙනවා. මරණින් මතු දිව්‍ය මනුෂ්‍යාදී සුගතියෙහි උපදිනවා යැයි වදාරා බුදුරජාණන්වහන්සේ මේ ජාතක කථාව දේශනාව නිමකළා. පින්වත්නි එදා ඇතා වෙලා උපන්නේ මුගලන් මහ රහතන් වහන්සේ ය. වඳුරු ආත්ම භාවයේ ඉපිදිලා සිටියේ සැරියුත් මහ රහතන් වහන්සේ ය. තිත්තිර පණ්ඩිතයන් වුණේ අප මහා බෝසතාණන් වහන්සේ ය.

## ක්‍රියාකාරකම 15.1

පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.

1. හික්මීමක් නැති භික්ෂූන් වහන්සේලා සැරියුත් තෙරුන්ට නිගරුවන සේ හැසිරුණහ. ☐
2. අනේපිඬු සිටුතුමා විසින් ජේතවනාරාමය ඉදිකරන ලද්දේ විශාලා මහනුවර ය. ☐
3. ඡබ්බග්ගිය යනු බුද්ධ කාලයේ වැඩසිටි නොහික්මුණු භික්ෂු පිරිසකි. ☐
4. සැරියුත් තෙරුන්ට ජේතවනාරාමයට වැඩම කරවීමට ප්‍රමාද වූයේ ගිලන් භික්ෂුවට උපස්ථාන කිරීමට වැඩම වූ නිසාය. ☐
5. බුදු සසුනේ පිළිගත් ක්‍රමය වන්නේ සාමාන්‍ය වයසේ පිළිවෙල ප්‍රධාන කොට සැලකීමයි. ☐
6. නුග ගසේ මුදුන් දල්ල නැබෙහි (බඩේ) ගෑවුණේ වඳුරාගේ ය. ☐
7. බෙල්ල උස් නොකොට නුග පැළයේ දලු කන ලද්දේ වඳුරා විසිනි. ☐
8. සතුන් තිදෙනාගෙන් වැඩිමහල්ලා ලෙස පිළිගෙන ඇත්තේ වටුවා ය. ☐
9. සතුන් තිදෙනා සුවෙන් කල් ගත කොට මරණින් පසු මිනිස් ආත්ම භාව ලැබූහ. ☐
10. එකල වටුවා වූයේ බුදුරජාණන් වහන්සේ ය. ☐



නොමිලේ බෙදා හැරීම පිණිසයි.

## ක්‍රියාකාරකම 15.2

පහත සඳහන් සුදුසු වචන යොදා ඡේදයේ හිස් තැන් පුරවන්න.

(නොරැවටීමේ, සබඳ, ගුණාංග, නුග, වැඩිහිටියා, ආදර්ශ, නොසිතා, නිහතමානි, කතාවෙන්, තනතුරේ)

තිත්තිර ජාතක කතාවෙන් සැබෑ .................................. කවුද යන්න සොයා බලා ඔහුව වැඩිහිටි .................................. තැබූ අයුරු දක ගත හැකි විය. එම .................................. වැඩිහිටියන්ට සැලැකීමේ අගය පෙන්වා දී ඇති අතර ම, තවත් වටිනා .................................. කීපයක් පිළිබඳ මතු කර දක්වා ඇත .................................. බව ඉන් ප්‍රධාන එකකි.තම තමන් වැඩිහිටි කොට ...... ............................ එය සොයා බලා නියම වැඩිහිටියා තෝරා ගන්නා ලද්දේ නිහතමානි කම නිසා ය. එමෙන් ම .................................. ගුණය ද මේ කතාවෙන් දක්වා ඇත. සතුන් තිදෙනාම .................................. ගස ගැන ............................ ..... තොරතුරු කියන්නට ඉදිරිපත් වීමෙන් ඒ බව පෙනී යයි. මේ ආකාර ...... ............................ රාශියක් තිත්තිර ජාතක කතාවෙන් හෙළි වේ.

## පැවරුම

ආගතපටිපාටි යනු බෞද්ධ පැවිදි ජීවිතය හා සම්බන්ධ පිළිවෙතකි. මේ ගැන ගුරු හිමියන්ගෙන් තොරතුරු දැනගෙන සටහනක් සකස් කරන්න.

### පුහුණුවට

**අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනො**
**චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං**

නිතර, සිල්වතුන්ට හා වැඩිහිටියන්ට වඳින, සලකන අයට ආයුෂය, වර්ණය, සැපය, බලය යන සතර ගුණයෝ වැඩෙති.